# JMC vLearning
"your virtual learning partner"

## ආර්ථික විද්‍යාව - ECN 103

**Prepared by - Chinthaka Kelum Udayasiri**
**Visiting Lecturer (University of Colombo)**
**BBA (SP) Mgt (University of Colombo)**
**Gold Medalist (University of Colombo)**
**CIM (UK) Passed Finalist**
**AAT Passed Finalist**

JMC vLearning "your virtual learning partner"

## ආර්ථික වර්ධනය




©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ආර්ථික වෘද්ධිය

ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩි වීමයි. එනම් භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමවුමේ ඉහළ යාමයි.

ආර්ථික වෘද්ධි අනුපාතය →

©JMC vLearning

# ආර්ථික වෘද්ධිය තීරණය කෙරෙන සාධක

- ❑ සම්පත් සම්භාරය
  - භෞතික ප්‍රාග්ධනය
  - මානව ප්‍රාග්ධනය
  - ස්වභාවික ප්‍රාග්ධනය
  - සමාජ ප්‍රාග්ධනය

- ❑ ඵලදායීතාව
  - තාක්ෂණය
  - නව්‍යතා බිහිවීම
  - පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජනය

- ❑ ආර්ථික ස්ථායීතාවය
- ❑ යහපාලනය
- ❑ සානුබල

©JMC vLearning

## ආර්ථික වෘද්ධියක වාසි

- සේවා නියුක්තිය ඉහළ යාම
- ජීවන මට්ටම ඉහළ යාම
- ආයෝජනය ශක්තිමත් වීම
- සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණය

©JMC vLearning

## ආර්ථික වෘද්ධියක අවාසි

- පරිසර ගැටළු ඇති වීම
- ආදායම් විෂමතා හට ගැනීම
- ආර්ථිකයේ උද්ධමන තත්වයක් හට ගැනීම
- වර්තමාන පරිභෝජනය පහළ යාම

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## ආර්ථික සංවර්ධනය

සංවර්ධනය යනු මිනිස් ජීවිතයේ ආර්ථික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ආදී සියලුම පැතිකඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වැඩි දියුණු වීමක් වන අතර සංවර්ධනය බහුමාණ ක්‍රියාවලියකි.

©JMC vLearning

## ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනස්කම්

- ආර්ථික වෘද්ධිය තුළින් ආර්ථිකය නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීම හෙවත් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර ආර්ථික සංවර්ධනය තුළින් ආර්ථික විද්ධියට අමතරව මිනිස් ජීවිතයේ ගුණාත්මක තත්වය ඉහළ යාමක් පෙන්නුම් කරයි.
- ආර්ථික වෘද්ධිය තුළින් ප්‍රමාණාත්මක වර්ධනයක් පමණක් පෙන්නුම් කරන අතර ආර්ථික සංවර්ධනය තුළින් ප්‍රමාණාත්මක පැතිකඩ මෙන්ම ගුණාත්මක පැතිකඩ පිළිබඳව ද අවධානය යොමු කරයි.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## මානව සංවර්ධනය

මානව සංවර්ධනය යනු මිනිසුන් විසින් තම මානව හැකියාවන් වර්ධනය කර ගැනීමත් සමඟ ම එම හැකියාවන් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික යන ක්ෂේත්‍ර යන්හි භාවිත කිරීමට ඇති හැකියාව ලබා දීමත්, අනාගත පරම්පාරවට ද එම අයිතිය තහවුරු කිරීමත් වේ.

©JMC vLearning

JMC vLearning
"your virtual learning partner"

## මානව සංවර්ධනයේ පැතිකඩ

- ආදායම
- අධ්‍යාපනය
- සෞඛ්‍ය තත්වය
- දේශපාලන ස්වාධීනබව
- යහපත් සමාජ සම්බන්ධතා
- සවිබල ගැන්වීම

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## තිරසාර සංවර්ධනය

අනාගත පරම්පරාවට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ඉඩකඩ අහිමි නොකරමින් වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනීම තිරසාර සංවර්ධනය ලෙස අදහස් කෙරේ.

එනම් වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගත යුත්තේ අනාගත පරම්පරාවන්ට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ඉඩ ප්‍රස්තා අහිමි නොකරමින් බව මින් අදහස් කරයි.

©JMC vLearning

## තිරසාර සංවර්ධනයේ පැතිකඩ

- ආර්ථික පැතිකඩ
- පාරිසරික පැතිකඩ
- සමාජීය පැතිකඩ

©JMC vLearning

JMC vLearning virtual learning partner

## පසුගිය විභාග ප්‍රශ්න

**1.7** එකම පිරිවැයක් යටතේ භාණ්ඩයක් හෝ සේවාවක් වෙනත් රටවල්වලට වඩා වැඩි ප්‍රමාණයකින් කිසියම් රටකට නිපදවිය හැකිනම්, හෝ එම භාණ්ඩ ප්‍රමාණයම වඩා අඩු පිරිවැයක් යටතේ නිපදවිය හැකිනම්, එය හඳුන්වනු ලබන්නේ:

(1) නිරපේක්ෂ වාසිය ලෙසයි.
(2) වෙළෙඳ අනුපාතය ලෙසයි.
(3) සාපේක්ෂ වාසිය ලෙසයි.
(4) ආරක්ෂණවාදය ලෙසයි.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛණයේ ජංගම ගිණුමේ ඇතුළත් **නොවන්නේ** කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන.
(2) භාණ්ඩ සහ සේවා අපනයනය.
(3) භාණ්ඩ සහ සේවා ආනයනය.
(4) ප්‍රාථමික ආදායම්.

©JMC vLearning

## පසුගිය විභාග ප්‍රශ්න

(A) (a) අන්තර්ජාතික වෙළඳාමේ වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ස්ථාවර විනිමය අනුපාතිකය (fixed exchange rate) සහ නම්‍ය විනිමය අනුපාතිකය [flexible (floating) exchange rate] අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් වන්නේ කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන.
(2) භාණ්ඩ අපනයන.
(3) රාජ්‍ය ප්‍රදාන.
(4) භාණ්ඩ ආනයන.

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## පසුගිය විභාග ප්‍රශ්න

### 05 වන ප්‍රශ්නය

(a) අන්තර්ජාතික වෙළඳාමේ අවාසි (disadvantages) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ආරක්ෂණවාදයේ (protectionism) වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) ඇමරිකානු ඩොලරයට ($) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය (devaluing) වීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වන ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

**1.12** කාර්යක්ෂමතාවය සහ ස්ථායීතාවය, තිරසාර සංවර්ධනයේ ……………… *(ආර්ථික / සමාජීය)* පැතිකඩයේ උප-සංරචකයන් වේ.

©JMC vLearning

## පසුගිය විභාග ප්‍රශ්න

### 05 වන ප්‍රශ්නය

(a) "රටක් ආනයන පාලනය කිරීම සඳහා තීරුබදු (tariffs) යොදාගනී".

රටක් ජාත්‍යන්තර වෙළඳාම පාලනය සඳහා භාවිත කරන වෙනත් ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **X** සහ **Y** යන රටවල් දෙක, සහල් සහ තිරිඟු යන නිෂ්පාදිත දෙකම නිෂ්පාදනය කරයි. මෙම රටවල් දෙක එක් ශ්‍රම ඒකකයකින් නිපදවනු ලබන සහල් සහ තිරිඟු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| නිෂ්පාදිතය / රට | සහල් (කිලෝ ග්‍රෑම්) | තිරිඟු (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| **X** | 8 | 2 |
| **Y** | 4 | 4 |

(i) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, නිරපේක්ෂ වාසියක් (absolute advantage) ඇත්තේ කුමන රටකටද යන්න **සඳහන් කරන්න.** (ලකුණු 02)

(ii) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, සාපේක්ෂ වාසියක් (comparative advantage) ඇත්තේ කුමන රටකටද යන්න **සඳහන් කරන්න.** *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(c) ගෙවුම් ශේෂ ලේඛණයේ ඇතුළත් ජංගම ගිණුමෙහි අඩංගු සංරචක (components) දෙකක්(02) **සඳහන් කරන්න.**

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## පසුගිය විභාග ප්‍රශ්න

**1.20** මානව සංවර්ධන පැතිකඩය තුළ ඇතුළත් අයිතම දෙකක්(02) සඳහන් කරන්න.
(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

### 05 වන ප්‍රශ්නය

(a) **X** සහ **Y** යන රටවල් දෙක, සහල් සහ තිරිඟු යන නිෂ්පාදිත දෙකම නිෂ්පාදනය කරයි. මෙම රටවල් දෙක මගින් එක් ශ්‍රම ඒකකයකින් නිපදවනු ලබන සහල් සහ තිරිඟු ඒකක ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| නිෂ්පාදිතය / රට | සහල් (කිලෝ ග්‍රෑම්) | තිරිඟු (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| X | 6 | 3 |
| Y | 2 | 4 |

එක් එක් නිෂ්පාදිතය නිපදවීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද යන්න **පැහැදිලි කරන්න** *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(b) එක්සත් ජනපද ඩොලරයට (US Dollar) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල මෑතකදී අවප්‍රමාණය වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) ජාත්‍යන්තර වෙළදාමේ ඇති වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

©JMC vLearning

## පසුගිය විභාග ප්‍රශ්න

(C) රටක ආර්ථික වර්ධනය තීරණය කරන සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

**1.20** "තිරසාර සංවර්ධනය (Sustainable Development)" යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

### 05 වන ප්‍රශ්නය

(a) ගෙවුම් ශේෂ ලේඛණයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් අයිතම දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ආරක්ෂණවාදයට පක්ෂව සහ විපක්ෂව ඉදිරිපත් කරන තර්ක දෙක(02) බැගින් **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(c) ඇමරිකානු ඩොලරයට (US Dollar) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)
(මුළු ලකුණු 10)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

## 05 වන ප්‍රශ්නය

(a) ඩොලර් ඉල්ලුම් කිරීමට හේතු දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **A** රට සහ **B** රට විසින් **X** සහ **Y** යන නිෂ්පාදිත දෙවර්ගයම නිෂ්පාදනය කරයි. රටවල් දෙක විසින් එක් ශ්‍රම ඒකකයක් භාවිතයෙන් නිපදවනු ලබන **X** සහ **Y** යන ඒකක ප්‍රමාණයන් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

| රට \ **නිෂ්පාදිතය** | **X (ඒකක)** | **Y (ඒකක)** |
|---|---|---|
| **A** | 8 | 4 |
| **B** | 3 | 6 |

(i) එක් එක් නිෂ්පාදිතය, නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසියක් ඇත්තේ කුමන රටටද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(ii) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් ඇත්තේ කුමන රටටද යන්න **පැහැදිලි කරන්න** *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(c) ගෙවුම් ශේෂ ලේඛණය තුළ ඇතුළත් කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"